# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,148 — 1935ක්වූ සැප්තැම්බර් මස 27 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**Badulla, No. 156.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වන 1935ක්වූ නොවැම්බර් මස 14වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු දහයට බදුල්ල කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යොදනවා ඇත. ඌව දිසාවේ බදුල්ල පලාතේ උඩුකිඳ කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක්.

අන්තිම ගම් සිතියමේ නො. 14. ගම—දෙහිවිනිපලාතකෝරලේ කුරුකුඳේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 38DC | පන්කැටියේමුල්ලේ වත්ත | — | ආණ්ඩුව, කුරුකුඳේ කේ. ජෙරනිස් සිල්වා විසින් අයුත්තේ භුක්ති විඳියි | අවුරුදු 7ක් වයස ඇති තේ වත්ත | 0 0 17 | 110 |

අන්තිම ගම් සිතියමේ නො. 31. ගම—දෙහිවිනිපලාතකෝරලේ පට්ටියගෙදර.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 16AB | අස්වැද්දුම | — | ආණ්ඩුව, ඩී. ඇම්. සිරිබද්දන විසින් අයුත්තේ භුක්ති විඳියි | කුඹුර | 0 1 20 | 110 |

අන්තිම ගම් සිතියමේ නො. 189. ගම—දඹවිනිපලාතකෝරලේ ගුරුතලාව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 3AQ | කැකුණගහඅරව | — | ආණ්ඩුව, ගුරුතලාවේ කේ. ඒ. ඇම්. අබ්දුල් විසින් අයුත්තේ භුක්ති විඳියි | කුඹුර | 0 0 15 | 160* |
| 3AN | එම | — | ආණ්ඩුව, ගුරුතලාවේ කේ. මොහිදීන් පිච්චේ විසින් අයුත්තේ භුක්ති විඳියි | එම | 0 0 14 | 160* |

අන්තිම ගම් සිතියමේ නො. 74. ගම—දඹවිනිපලාතකෝරලේ හිඟුරුගමුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 6J | නාරන්කඳුරේකුඹුර | — | ආණ්ඩුව, හිඟුරුගමුවේ බෝකොටු වෙඩගෙදර සුදී විසින් අයුත්තේ භුක්ති විඳියි | කුඹුර | 0 0 38 | 110 |

අන්තිම ගම් සිතියමේ නො. 68. ගම—දඹවිනිපලාතකෝරලේ නාවෙල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 18J | කුරුඳුගොල්ල | — | ආණ්ඩුව, ඉතනවැල්ලහාවේ මීයනා අල්ලාපිච්චේ විසින් අයුත්තේ භුක්ති විඳියි | කුඹුර | 0 0 17 | 110 |
| 18K | එම | — | එම | එම | 0 0 27 | 110 |

447——J. N. 49439—134 (9/35)
S 1

මුල් පිටියමේ නො. 2,888. ගම—බදුලු පලාතේ බණ්ඩාරවෙල පළාත් නගරසභා සීමාවතුල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 1E | පිල්ලේඅරුගේවත්ත සහ බෝකොටුවේ වත්ත | — .. | ආණ්ඩුව සහ නුවරඑළියේ පදිංචි (1) කෙලර, (2) ෆිලිප්ස්, (3) මාර්ශල්, (4) ඇන්තනි, (5) සින්නසියා, (6) ජෝජ්, (7) ෆ්‍රැන්සිස්, (8) රොබී, (9) ජේඇකිම්, (10) මින්සන්ට් | අවුරුදු 22ක් පමණ වයසැති "ගෑවිලියා," "ගම්" සහ අඹ ගස් වවාතිබෙන වත්ත | 0 2 14·3 | 1,500† |

*නො. F. V. P. 189 දරණ අන්තිම ගම් පිටියමේ 3AQ සහ 2AN යන නොම්මර ඇති ඉඩම්කැබලි අයුත්තේ බුක්ති විඳින අය, එසේ බුක්තිවිඳින එක එක ඉඩම් කැබැල්ලට රුපියල් 5ක් වැඩියෙන් ගෙවිය යුතුයි.

†නො. P. P. 2,888 දරණ මුල් පිටියමේ 1E යන නොම්මරය ඇති ඉඩම් කැබැල්ල සියේට 70ක් අඩුකොට විකුණනු ලැබේ.

ඉහතකී ඉඩම් ගැන වැඩිදුර කාරණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන්ද, ඒවායේ පිටියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1935ක්වූ සැප්තැම්බර් මස 24වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කරවාකුපත්තුවේ, කල්මුනෙයිකුඩියේ ගැණු පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

පිටියමේ නො. A 213. ගම—කල්මුනෙයි කුඩියිරුප්පුවේ 4වෙනි කොට්ඨාසය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පත්තිච්චෙයිඅඩිවලවු .. | පුවක්ගස් 12යි, තල්ගස් 1යි, අඹගස් 2යි, පොල්ගස් 8යි, දෙහිගස් 2යි, කෙහෙල්පඳුරු ස්වල්පයක් සහ තාවකාලික මඩුවක්ද මෙම ඉඩමෙහි තිබේ | (1) මීරාලෙව්වෙයි අහමදුලෙව්වෙ, (2) කදිරේස නාවුර් උම්මා, දෙදෙනාම කල්මුනෙයි කුඩියිරුප්පුවේ 4වෙනි කොට්ඨාසයේ | 0 0 26·2 |
| 2 | කරෙයියාඩිවලවු .. | පොල්ගස් 7යි, දෙහිගස් 1යි, කොහොඹගස් 1යි, කෙසෙල්පඳුරු ස්වල්පයක් සහ තාවකාලික මැටි මඩුවක්ද මෙම ඉඩමෙහි තිබේ | කල්මුනෙයි කුඩියිරුප්පුවේ 4වෙනි කොට්ඨාසයේ අබ්දුල්ලා සුලයිමා ලෙබ්බේ | 0 0 8·5 |
| 3 | මුන්දිරිඅඩිවලවු .. | වත්තෙහි පොල්ගස් දෙකක් තිබේ | (1) ඔමාරු ලෙබ්බේ මරික්කාර් සාරඋම්මා, (2) මොහිඩීන්බාව පාතුමුත්තු, (3) උතුමන්කංඩු අවුකාර්, සියලුදෙනාම කල්මුනෙයි කුඩියිරුප්පුවේ 4වෙනි කොට්ඨාසයේ | 0 0 27·6 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ ඔක්තෝබර් මස 29වෙනි දින පෙරවරු 10යේ කාසිසමට කල්මුනේ කානායමදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ සැප්තැම්බර් මස 24වෙනි දින මඩකලපුවේ කච්චේරියේදීය.

සී. සිත්තම්පලම්,
මඩකලපුවේ ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—තුරෙයි නීලාවනෙයි ගමේ මාරකට් ගොඩනැගිල්ලක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

පිටියමේ නො. A 212. ගම—කරවකු පත්තුවේ තුරෙයි නීලාවනෙයි මධ්‍යමගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | අයියලෙයියාඩිවලවු .. | වයස අවුරුද්දක් පමණවන පොල්පැල 9යි, අවුරුදු 1කේ සිට 2 දක්වා වයසැති තල්පැල 4ක් සහ පරන කෙසෙල් පඳුරු ස්වල්පයක්ද මෙම වත්තෙහි තිබේ | නාගමුත්තු කන්නම්මා, තුරෙයි නීලාවනේ මධ්‍යමගමේ | 0 0 26·2 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ ඔක්තෝබර් මස 29වෙනි දින පස්වරු 3වෙනි කාසිසමට කල්මුනේ කානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ සැප්තැම්බර් මස 24වෙනි දින මඩකලපුවේ කච්චේරියේදීය.

සී. සිත්තම්පලම්,
මඩකලපුවේ ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

### මහනුවර පලාතේ ආණ්ඩුවේ ඉඩම්වල මැණික් ගැරීමේ බලය ලබාගැණීමට ඉල්ලුම්පත්‍ර.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ පිහිටාතිබෙන මෙහි පහත සඳහන් ඉඩම්තුල අවුරුද්දක් ඇතුලත මැණික් හැරීමේ බලය ලබාගැණීම පිණිස සීල්කරණලද ඉල්ලුම්පත්‍ර මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1935ක්වූ ඔක්තෝබර් මස 30වෙනි බදාදා පෙරවරු 11 දක්වා මහනුවර කච්චේරියේදී භාරගනු ලැබේ.

2. ඉල්ලුම්පත්‍ර කවරවල දමා සීල්කර කවරවල වම් පැත්තේ "මැණික් හැරීමට බලය ලබාගැණීමට ඉල්ලුම්පත්‍ර" කියා ලියා එවිය යුතුයි. ඉහතකී දින පෙරවරු 11ට ඉල්ලුම්පත්‍ර ගලවා බලනවිට ඉල්ලුම්පත්‍රය සත්‍යවූ එකක් බව ඔප්පු කිරීම පිණිස ඉල්ලුම්කරුවන් හෝ ඔවුන් වෙනුවට පෙනී සිටින්ට නියිආකාර පත්කරණලැබූ වෙන අයවළුන් හෝ මධ්‍යම දිසාවේ ඒජන්තඋන්නාන්සේ ඉදිරිපිට පෙනීසිටින්ට ඕනෑය.

3. ඒජන්තඋන්නාන්සේ විසින් තෝරාගනුලබන ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා, ඉල්ලුම්පත්‍රයේ සඳහන් සම්පූර්ණ මුදල එදිනම වහාම ගෙවා නො. G. A.—A 133 දරණ ෆෝරමයේ ඉල්ලුම්පත්‍ර භාරගන්නාලද කොන්දේසි සියල්ලම හරියාකාර ඉෂ්ටකිරීමේ පොරොන්දුව සිට අවසරපත්‍රයක් එකී ඉල්ලුම්කරු විසින් අත්සන්කළ යුතුයි.

4. ඉල්ලුම්පත්‍රය භාරගත් දින සිට තුන්මාසයක් ඇතුලතදී ඉල්ලුම්කරු විසින් මැණික් හෑරීමට ගතයුතු අවසරපත්‍රයක් අත්සන් නොකළහොත් ඔහු විසින් බදිනලද මුදල රජ සන්තක කරනු ලැබේ.

5. අවසරපත්‍රය ලැබූ තැනැත්තා එකී ඉඩමේ පදිංචිව සිටින කාලයතුලදී එම ඉඩමතුල තිබෙන ගස්වලට වන තුවාලාදියට සහ උදුරාදමන සහ ඉදිරිවැටෙන ගස්වලද වටිනාකම ගෙවිය යුතුවේ.

6. ඉහතකී මැණික් හෑරීමේ බලය ගැනීමට රු. 20කට අඩු ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

7. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර කිසිම ප්‍රශ්නයක් නැතුව පිළිගැනීමට හෝ ප්‍රතික්ෂෙප කිරීමටද, ඉල්ලුම්පත්‍රයේ සඳහන් කාරණාවලින් යම් කොටසක් භාර ගැනීමටද මධ්‍යම දිසාවේ ඒජන්තඋන්නාන්සේට බලය තිබේ.

8. භාරගත් ඉල්ලුම්පත්‍රකරු විසින් වලවල් ගොඩකර දැමීමට සහ අවසරපත්‍රයේ කොන්දේසි හරියාකාර ඉෂ්ටකිරීමටද ඇප වශයෙන් රු. 100 බැන්ද යුතුයි. හෑරීම් අවසානයේදී ඒජන්තඋන්නාන්සේ සතුටුවෙන පරිදි වලවල් නිසියාකාර වසාදැමූපසු ඉහතකී ඇප මුදල ආපසු දෙනු ලැබේ.

9. අවසරපත්‍රය ලැබූ අය විසින් හෑරීම පටන්ගන්නාවූද අවසානකරන්නාවූද දිනයන් කොළඹ ආණ්ඩුවේ ලෝහධාතු ශාස්ත්‍රඥතුමාට දැනුම්දිය යුතුයි. තවද එතුමාට හෝ එතුමාගේ නිලධාරීන්ට හෑරුම් පතල් ආදිය ඕනෑමවිටක පරීක්ෂාකර බැලීමටද ඉඩහැරිය යුතුයි.

10. මේ සම්බන්ධ වැඩිදුර කරුණු මධ්‍යම දිසාවේ ඒජන්තඋන්නාන්සේගෙන් මහනුවර කච්චේරියේදී දැනගත හැක.

ඉහත සඳහන් ඉඩම.

මධ්‍යම දිසාවේ උඩබුලත්ගම කොට්ඨාසයේ පස්බාගේ කෝරළේ රඹුක්පිටිය සහ අඹගමුව කෝරළේ අඹගමුව නමැති ගම්තුල නැගෙණහිරට තියදගලවත්ත සහ බස්නාහිරට සැන්ට් ක්ලයිව්වත්ත යන වතු දෙක අතරේ පිහිටි දම්වැල් 1½ක් පළලැති මහවැලිගඟේ පතුලේ දිගින් දම්වැල් 2ක ප්‍රමාණයතුල වේ.

ආර්. ඇම්. ජී. මොහිතෙපති,
මධ්‍යම දිසාවේ උප ඒජන්තඋන්නාන්සේ.

වර්ෂ 1935ක්වූ සැප්තැම්බර් මස 19වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

---

තොටුපල් රේන්ද විකිනීම.

වර්ෂ 1936ක්වූ ජනවාරි මස 1වෙනි දින සිට දෙසැම්බර් මස 31වෙනි දිනෙන් අවසාන වන අවුරුද්දට හන්වැල්ල, පූගොඩ වැවල, හේනෙමුල්ල, ගොරකපොල, දීගල, එගොඩඋයන, සිදුව සහ මුතුවාඩිය යන තොටුපල් රේන්ද මිලේට ගැනීම පිණිස ඉල්ලුම්පත්‍ර වර්ෂ 1935ක්වූ ඔක්තෝබර් මස 23වෙනි දින පෙරවරු 10ට කොළඹ කච්චේරියේදී දිස්ත්‍රික්රෝඩ් කොමිටියේ ප්‍රධානතැන විසින් භාරගනු ලැබේ. සියලුම ඉල්ලුම්පත්‍ර ඒ සඳහා පිළියෙළකර තිබෙන කොලවල ලියාදිය යුතුය. ඉල්ලුම්පත්‍රවලට පාවිච්චිකරන කොල සහ විකිනීම සම්බන්ධ කොන්දේසි යනාදිය කොළඹ දිස්ත්‍රික් රෝඩ් කොමිටි කන්තෝරුවට පැමිණීමෙන් ලබාගන්ට පුළුවන.

ආර්. බී. ජෑන්ස්,
කොමිටියේ ප්‍රධානතැන වෙනුවට,

වර්ෂ 1935ක්වූ සැප්තැම්බර් මස 23වෙනි දින
කොළඹ දිස්ත්‍රික් රෝඩ් කොමිටි කන්තෝරුවේදීය.

---

## 1920සේ නොම්මර 11 දරණ ප්‍රදේශික ආණ්ඩු ව්‍යවස්ථාව.

### 1920 අංක 11 දරණ පළාත් ආණ්ඩුසභා ආඥාපණත යටතේ දැන්වීමයි.

### කොලොන්නාවේ නගරබද පළාත් ආණ්ඩු සභාවේ සමාජිකයින් තේරීම.

වර්ෂ 1935ක්වූ නොවැම්බර් මස 7වෙනි බ්‍රහස්පතින්ද කොලොන්නාවේ පළාත් ආණ්ඩු සභාවේ සමාජිකයින් තේරීමක් පැවැත්වීමට අදහස්කර තිබෙන බව මෙයින් දන්වමි. සමාජිකයෙකු වීමට ඉල්ලුම්කරණ තැනැත්තාගේ නම ලියවිල්ලකින් යෝජනාකල යුතුයි. එක් එක් කොට්ඨාසය වෙනුවෙන් ඉදිරිපත්වන ඉල්ලුම්කරුවන්ගේ නාම යෝජනාපත්‍ර ඒ ඒ කොට්ඨාසයේ ඡන්දදායකයින්ගේ නාමලේඛනයට ඇතුලත් අයගෙන් අඩු වශයෙන් දෙදෙනෙකු විසින් අත්සන් තබා සමාජිකයින් පත්කිරීම සඳහා නියමකරගෙන තිබෙන වර්ෂ 1935ක්වූ නොවැම්බර් මස 7වෙනි දින උදේ 10ට හෝ ඊට ප්‍රථම කොලොන්නාවේ නගරබද පළාත් සභා කාර්‍යාලයේදී භාරදිය යුතුයි. යම් කොට්ඨාසයක් වෙනුවෙන් එක් ඉල්ලුම්කරුවෙකුට වැඩි ගණනක් යෝජනාකරණු ලැබූ කොට්ඨාශය වෙනුවෙන් සමාජිකයින් තේරීම පිණිස කැමැත්තදීමට සුදුසු අයවළුන්ගේ ඡන්දය මෙහි පහත සඳහන් ස්ථානයන්හි වර්ෂ 1935ක්වූ නොවැම්බර් මස 25වෙනි දින උදේ 8ට පටන් සවස 5 දක්වා ගනු ලැබේ.

ඡන්දයගන්නා ස්ථානය.

| | |
|---|---|
| නො. 1 ගොතටුව .. | අංගොඩපාරේ, ගොතටුවේ ආණ්ඩුවේ ඉඩමේ තාවකාලික මඩුව. |
| නො. 2 අංගොඩ කොලොන්නාව | දෙමටගොඩ වැල්ලම්පිටිය පාරේ සිට අංගොඩ පාරට හැරෙන ස්ථානයෙහි ආණ්ඩුවට අයත් ඉඩමේ තාවකාලික මඩුව. |
| නො. 3 නාගහමුල්ල | කොලොන්නාවේ යූ. ඩී. සී. කන්තෝරුව පිහිටා තිබෙන ඉඩමේ තාවකාලික මඩුව. |
| නො. 4 වැල්ලම්පිටිය | උඟුරුගොඩවත්ත–අවිස්සාවේල්ල පාරේ ඒ. ඩී. ඇස්. සූරියබණ්ඩාර මහතාගේ ගාලේ තාවකාලික මඩුව. |
| නො. 5 මීතොටමුල්ල | නැසීගිය පී. ඈන්. කපාඩියා මහත්මයාගේ සියඹලාගහවත්ත නමැති ඉඩමේ තාවකාලික මඩුව. |
| නො. 6 වේරගොඩ .. | වේරගොඩ රේල්පාලමේ බස්නාහිර පැත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩමෙහි සාද තිබෙන තාවකාලික මඩුව. |

ආර්. එච්. වෙවිසෝන්,
බස්නාහිර පලාතේ දිසාපතිතුමා.

වර්ෂ 1935ක්වූ සැප්තැම්බර් මස 25වෙනි
කොළඹ කච්චේරියේදීය.

---

## 1920 අංක 11 දරණ පළාත් ආණ්ඩු ආඥාපණත යටතේ දැන්වීමයි.

### මොරටුවේ නගරබද පළාත් ආණ්ඩු සභාවේ සමාජිකයින් තේරීම.

වර්ෂ 1935ක්වූ නොවැම්බර් මස 16වෙනි සෙනසුරාද මොරටුවේ පළාත් ආණ්ඩුසභාවේ සමාජිකයින් තේරීමක් පැවැත්වීමට අදහස්කර තිබෙන බව මෙයින් දන්වමි. සමාජිකයෙකු වීමට ඉල්ලුම්කරණ තැනැත්තාගේ නම ලියවිල්ලකින් යෝජනා කළයුතුයි. එක් එක් කොට්ඨාසය වෙනුවෙන් ඉදිරිපත්වන ඉල්ලුම්කරුවන්ගේ නාම යෝජනාපත්‍ර ඒ ඒ කොට්ඨාසයේ ඡන්දදායකයින්ගේ නාමලේඛනයට ඇතුලත් අයගෙන් අඩු වශයෙන් දෙදෙනෙකු විසින් අත්සන්තබා සමාජිකයින් පත්කිරීම සඳහා නියමකරගෙන තිබෙන වර්ෂ 1935ක්වූ නොවැම්බර් මස 16වෙනි දින උදේ 10ට හෝ ඊට ප්‍රථම මොරටුවේ නගරබද පළාත් සභාකාර්‍යාලයේදී භාරදිය යුතුයි.

යම් කොට්ඨාශයක් වෙනුවෙන් එක් ඉල්ලුම්කරුවෙකුට වැඩි ගණනක් යෝජනාකරණු ලැබුවෙහිනම් එසේ යෝජනාකරණු ලැබූ කොට්ඨාස වෙනුවෙන් සමාජිකයින් තේරීම පිණිස කැමැත්තදීමට සුදුසු අයවළුන්ගේ ඡන්දය මෙහි පහත සඳහන් ස්ථානයන් හා දිනයන්හි උදේ 8 පටන් සවස 5 දක්වා ගනු ලැබේ.

| කොට්ඨාශය. | ඡන්දයගන්නා ස්ථානය. | දිනය. |
|---|---|---|
| නො. 1 ලක්ෂපතිය | ශුද්ධ මතියස් පාඨශාලාව, ලක්ෂපතිය | 1935 නොවැම්බර් 29 |
| නො. 2 උයන | ලුනාවේ නානායම් භූමියේ තාවකාලික මඩුව | ,, 29 |
| නො. 3 රාවතාවත්ත | නගර සභාවේ කාර්‍යාලය, ඉදම | ,, 29 |
| නො. 4 මොරටුවැල්ල | මොරටුවැල්ලේ ශුද්ධ සෙබස්තියන් දේවස්ථානයට පිටිපස තිබෙන රෝමානු කතෝලික සවභාෂා පාසැල | ,, 30 |
| නො. 5 කොරලවැල්ල | කොරලවැල්ලේ ශුද්ධ මයිකල් දේවස්ථාන ඉඩමේ තිබෙන රෝමානු කතෝලික සවභාෂා පාසැල | ,, 30 |
| නො. 6 කටුබැද්ද | රාවතාවත්තපාරේ තිබෙන රෝමානු කතෝලික සවභාෂා පාසැල | ,, 30 |

| කොට්ඨාශය. | ඡන්දයගන්නා ස්ථානය. | දිනය. 1935. |
| --- | --- | --- |
| නො. 7 මොරටුමුල්ල | මොරටුමුල්ලේ ශුද්ධ අන්තෝනි දේවස්ථාන ඉඩමේ තිබෙන රෝමානු කතෝලික ස්වභාෂා පාසැල | නොවැම්බර් 30 |
| නො. 8 ඉදිබැද්ද | ශුද්ධ මයිකල් දෙවස්ථානය පිටිපස බොරළුව පාරේ පිහිටා තිබෙන ඇන්ග්ලිකන් ස්වභාෂා පාසැල | ,, 30 |

ආර්. එච්. වෙව්හෝන්,
බස්නාහිර පළාතේ දිසාපතිතුමා.

වම් 1935ක්වූ සැප්තැම්බර් මස 20 වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

---

## 1920 අංක 11 දරණ පළාත් ආණ්ඩු සභා ආඥාපනත යටතේ දැන්වීමයි.

### කෝට්ටෙ නගරබද පළාත් ආණ්ඩුසභාවේ සමාජිකයින් තේරීම.

වම් 1935ක්වූ නොවැම්බර් මස 21වෙනි බ්‍රහස්පතින්දා කෝට්ටෙ පළාත් ආණ්ඩුසභාවේ සමාජිකයින් තේරීමක් පැවැත්වීමට අදහස්කර තිබෙන බව මෙයින් දන්වමි. සමාජිකයෙකුවීමට ඉල්ළුම්කරණ තැනැත්තාගේ නම ලියවිල්ලකින් යෝජනාකල යුතුයි. එක් එක් කොට්ඨාශය වෙනුවෙන් ඉදිරිපත්වන ඉල්ලුම්කරුවන්ගේ නාම යෝජනාපත්‍ර ඒ ඒ කොට්ඨාශයේ ඡන්දදායකයින්ගේ නාමලේඛනයට ඇතුළත් අයගෙන් අඩු වශයෙන් දෙදෙනෙකු විසින් අත්සන්තබා සමාජිකයන් පත්කිරීම සඳහා නියමකරගෙන තිබෙන වම් 1935ක්වූ නොවැම්බර් මස 21වෙනි දින උදේ 10ට හෝ ඊට ප්‍රථම කෝට්ටේ නගරබද පළාත් සභා කාර්යාලයේදී භාරදිය යුතුයි. යම් කොට්ඨාසයක් වෙනුවෙන් එක් ඉල්ළුම්කරුවෙකුට වැඩිගණනක් යෝජනාකරණු ලැබුවොත්නම් එසේ යෝජනාකරණු ලැබූ කොට්ඨාසය වෙනුවෙන් සමාජිකයින් තේරීම පිණිස කැමැත්තදීමට සුදුසු අයවළුන්ගේ ඡන්දය මෙහි පහත සඳහන් ස්ථානයන් හා දිනයන්හි උදේ 8 පටන් සවස 5 දක්වා ගනු ලැබේ.

| කොට්ඨාසය. | ඡන්දගන්නා ස්ථානය. | දිනය. |
| --- | --- | --- |
| නො. 1 යක්බැද්ද | වැලිකඩ යූ. ඩී. සී. වෙළඳපොළ | දෙසැම්බර් 13 |
| නො. 2 වැලිකඩ | ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව, නාවල | ,, 13 |
| නො. 3 නාවල | ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාව, නාවල | ,, 14 |
| නො. 4 ඇතුල් කෝට්ටෙ | කරුණ බෞද්ධ සංගමයේ සමිතිශාලාව, ඇතුල් කෝට්ටෙ | ,, 13 |
| නො. 5 පිට කෝට්ටෙ | පිටකෝට්ටේ යූ. ඩී. සී. වෙළඳපොළ | ,, 14 |
| නො. 6 පාගොඩ | කෝට්ටෙ-නුගේගොඩපාරේ පී. ඩබ්ලිව්. ඩී. කම්කරුවන්ගේ ලැයිම පිහිටි ඉඩමෙහි තාවකාලිකමඩුව, මිරිහානෙ | දෙසැම්බර් 14 |
| නො. 7 නුගේගොඩ | නුගේගොඩ ස්ටේෂම්පල ඉදිරිපිට යූ. ඩී. සී. එකට අයිති ඉඩමෙහි සාදා තිබෙන තාවකාලික මඩුව | ,, 14 |
| නො. 8 කිරිල්ලපොනේ | කිරිල්ලපොනේ ඒ. ඊ. අබේරත්න මුදලිතුමාගේ ගෘහය ඉදිරිපිට මියුනිසිපල් එකට අයත් ඉඩමෙහි තිබෙන තාවකාලික මඩුව | ,, 13 |

ආර්. එච්. වෙව්හෝන්,
බස්නාහිර පළාතේ දිසාපතිතුමා.

වම් 1935ක්වූ සැප්තැම්බර් මස 24වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

---

## නුවරඑළියේ නගරබද පළාත් ආණ්ඩුසභාවට වම් 1935ට සමාජිකයන් තේරීම.

වම් 1935ගේ නොවැම්බර් මස 5වෙනි අඟහරුවාදා නුවරඑළියේ නගරබද පළාත් ආණ්ඩුසභාවට සාමාජිකයන් තෝරා පත්කිරීමට අදහස්කර සිටින බැව් මෙයින් දැනුම්දෙමි.

ඒ සමාජිකධුර ඉල්ලුම්කරුවන් සියල්ලෝම ලියවිලිවලින් එසේ කළ යුතුයි. සමාජිකධුර ඉල්ළුම්කරණ කොට්ඨාසයේ ඉතා අඩුගණනේ ඡන්දදායකයන් දෙදෙනෙකුගේවත් අත්සන් ඇතුව ඒ සමාජිකධුර ඉල්ළුම්පත්‍ර භාරදිය යුතුයි.

සමාජිකයන් තේරීමේ දිනයවන වම් 1935ගේ නොවැම්බර් මස 5වෙනි දින උදේ 10ට හෝ ඊට කලින් ඒ ඉල්ලුම්පත්‍ර නුවරඑළියේ නගරබද පළාත් ආණ්ඩුසභා කන්තෝරුවට භාරදිය යුතුයි.

යම් කොට්ඨාසයක එක් අයෙකුට වඩා සමාජිකධුර ඉල්ළුම්කරුවන් සිටියොත්නම්, ඒ වෙනුවෙන් ඡන්දය ගැනීමට සූදානම් කරණලද ස්ථානවලදී මෙහි පහත සඳහන් දිනවලදී ඡන්දය ගනු ලැබේ.

ඡන්ද ගැනීම උදේ 9ට පටන්ගෙන සවස 4ට අවසන් කරණු ලැබේ.

| කොට්ඨාස නො. | ඡන්දගැනීමේ දිනය. | ඡන්දයගැනීමේ ස්ථානය. |
| --- | --- | --- |
| 1 | 1935 නොවැම්බර් මස 20 | නුවරඑළියේ නගරබද පළාත් ආණ්ඩුසභා කන්තෝරුව |
| 2 | එම 20 .. | එම |
| 3 | එම 20 .. | එම |
| 4 | එම 20 .. | එම |
| 5 | එම 20 .. | නුවරඑළියේ කච්චේරිය |
| 6 | එම 20 .. | එම |
| 7 | එම 20 .. | එම |
| 8 | එම 20 .. | එම |

ආර්. ඇම්. බේමිස්,
උප ඒජන්තතුමා.

වම් 1935ක්වූ සැප්තැම්බර් මස 23වෙනි දින
නුවර එළියේ කච්චේරියේදීය.

---

## පුත්තලමේ නාගරික සභාවට වම් 1935ක්වූ අවුරුද්දට මන්ත්‍රීන්තේරීම.

මෙයින් දැනුම්දෙනුලබන්නේ වම් 1935ක්වූ නොවැම්බර් මස 15වෙනි දින සිකුරාදා පුත්තලමේ නාගරික සභාවේ මන්ත්‍රීන් තේරීම පවත්වන්ට අදහස්කර තිබෙන බවයි. සෑම ඉල්ලුම්කාරයින්ගේ නම් ලියවිල්ලකින් සඳහන්කරන්ට ඕනෑ වත්හැර එක එක ඉල්ලුම්කාරයා පෙනීසිටින කොටසේ කැමැත්තදෙන අයවලුන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් දෙදෙනෙක් විසින් ඉතා තකී ලියවිල්ල අත්සන්කරන්ට ඕනෑය. එම ලියවිල්ල වම් 1935ක්වූ නොවැම්බර් මස 15වෙනි සිකුරාදා පෙරවරු 10ට මත්තෙන් පුත්තලමේ නාගරික සභාවේ කාර්යාලයට භාරදෙන්ට ඕනෑය.

එක එක කොට්ඨාසයකට ඉල්ලුම්කාරයෙක් එක්කෙනෙකුට වැඩි ගණනකගේ නම් සඳහන්කළොත් එම කොට්ඨාසයේ කැමැත්තදෙන අයවිලුන්ගේ ඡන්ද වම් 1935ක්වූ දෙසැම්බර් මස 7 සෙනසුරාදා පෙරවරු 9ට සහ පස්වරු 3ට අතරතුරෙහි ගනු ලැබේ.

එක එක කොට්ඨාශයේ ඡන්ද ගන්න ස්ථානය මෙහි පහත සඳහන්කර ඇත :—

නොම්බර් 1 කොට්ඨාසයට ජපණ පාරෙහි පිහිටි ආණ්ඩුවේ ස්වභාෂා ගෑණු පාඨශාලාවෙහි.
,, 2 ,, වෙට්ටු වීදියෙහි පිහිටි සන් ඇන්ඩෘ පිරිමි පාඨශාලාවෙහි.
,, 3 ,, පුත්තලමේ නාගරිකසභාවේ කාර්යාලයෙහි.
,, 4 ,, අනුරාධපුර පාරෙහි වේනකුඩිරිප්පු වෙහි පිහිටි කාන්වන්ට්එකෙහි ගෑණු පාඨශාලාවෙහි.

ඒ. ඊ. ක්‍රිස්ටෝපල්ස්,
ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

වම් 1935ක්වූ සැප්තැම්බර් මස 21වෙනි දින
පුත්තලමේ කච්චේරියේදීය.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.